මනුෂ්‍ය ඝාතනයක් සිදුකෙරී ඇතැයි පැවසෙන සිදුවීමක් හා ඒ හා බැඳුණු දිවි අහිමි කරගැනීමක් ඇතුළත් විදෙස් පුවතක් ශ්‍රී ලංකාවේ මාධ්‍ය ඔස්සේ වාර්තා කර තිබූ ආකාරය අපට නිරීක්ෂණය කළ හැකි විණි.

මෙහිදී එම පුවත රාමුගත කොට තිබුණේ දිවි අහිමි කරගැනීමට ප්‍රමුඛතාවය ලැබෙන අයුරිනි. කෙසේ වෙතත් එම පුවත් වාර්තාවේ උපකාරක අංකද සඳහන් කොට නොතිබුණි. මෙම පුවත දිවි අහිමි කරගැනීමට ප්‍රමුඛත්වය ලබාදෙමින් ඉදිරිපත් කරන්නේ නම් උපකාරක අංක සඳහන් කිරීමද අවශ්‍ය බව අප පෙන්වා දෙන්නේ, ඒ ඔස්සේ වක්‍රාකාරයෙන් සිදුවන තවත් දිවි අහිමි කරගැනීමකට වන පෙළඹවීම අවම කිරීම සඳහායි.

කෙසේ නමුත් මෙම පුවත ජාත්‍යන්තර මාධ්‍ය මගින් ඉදිරිපත් කොට තිබූ ආකාරයද නිරීක්ෂණය කිරීම වටී. ද වොෂිංටන් පෝස්ට් සහ ද නිව්යෝර්ක් ටයිම්ස් යන පුවත්පත් දෙකම මෙම සිදුවීම් මාලාව රාමුගත කොට තිබුණේ සිදුවී ඇති මනුෂ්‍ය ඝාතනයට ප්‍රමුඛත්වය ලබාදෙමිනි. දිවි අහිමි කරගැනීමේ සිදුවීම එම පුවත් දෙකේ සිරස්තල තුළ හෝ නොතිබුණි.

මෙම ප්‍රවෘත්තිය ජාත්‍යන්තර මාධ්‍ය තුළ රාමුගත කොට ඇති ආකාරය වඩා නිවැරදි යැයි ඔබ නොසිතන්නේද? මෙම විදෙස් පුවත වාර්තා කරනා ජාත්‍යන්තර මාධ්‍ය තුළ පවා ඊට සම්බන්ධ දිවි අහිමි කරගැනීම අවම ප්‍රමුඛත්වයකින් ඉදිරිපත් වී ඇතිනම්, දිවයින පුවත දිවි අහිමි කරගැනීමට ප්‍රමුඛත්වය ලබාදෙමින් එය ඉදිරිපත් කරන්නේ මන්ද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #Website #News #Divaina #TheNewYorkTimes #TheWashingtonPost